

NILET

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
(NILET) 2007 අංක 26 දරන පනත මගින්
ව්‍යස්ථාපිත කරන ලද අතර
ආයතනයේ පරිපාලන කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට
ආයතනික කාර්ය මණ්ඩලය සහය දක්වනු ලබයි.

(NILET) හි ප්‍රධාන කාර්යාලය
අංක (321/1) හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය
යන ලිපිනයේ ස්ථාපිත කර ඇත.

(NILET) හි පනත ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන කාර්ය වන්නේ
භාෂා අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම වන අතර
ආයතනයේ අනන්‍ය ක්‍රමෝපායන් මගින් එම කාර්යය
වඩාත් ප්‍රවර්ධනය කරනු ලබයි

(NILET) මගින්
රාජ්‍ය නිලධාරීන්ට භාෂා පුහුණුකරුවන්ට භාෂා හා
භාෂණ පරිවර්තකයන්ට හා පොදු ප්‍රජාව උදෙසා
විශේෂයෙන් සැලසුම් කරන ලද භාෂා අධ්‍යාපන වැඩසටහන්
ප්‍රදානය කරනු ලබයි.

අන්තර්ගතය

පිටුව 01 - සභාපතිතුමාගේ පණිවිඩය

පිටුව 02 - කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන මණ්ඩලය

පිටුව 03 - අපගේ අරමුණු

පිටුව 05 - NILET ගැන

පිටුව 09 - භාෂාමය දොරගුලු හැරීම

පිටුව 10 - අපේ සිසුන් කියන දේ

පිටුව 11 - විෂයමාලා සංවර්ධනය

පිටුව 13 - සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාව

පිටුව 16 - PRH ක්‍රමවේදය

පිටුව 17 - NILET මත NLEAP හි බලපෑම

පිටුව 18 - පාලමක් ලෙස භාෂාව

පිටුව 19 - වැඩසටහන් සහ පාඨමාලා

පිටුව 24 - මූල්‍යමය ක්‍රියාකාරිත්වය

පිටුව 31 - 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පිටුව 33 - විස්තීරණ ආදායම් ප්‍රකාශය

පිටුව 34 - ශුද්ධ වත්කම් / කොටස්වල හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

පිටුව 35 - මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

පිටුව 36 - මුල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

පිටුව 46 - විගණන වාර්තාව

පිටුව 52 - 2022 විගණකාධිපති වාර්තාවේ කරුණු පිළිබඳ නිරීක්ෂණය

පිටුව 54 - අභියෝග

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

සාර්ථකත්වයේ රහස NILET

වර්තමාන ගතික ලෝකයේ දැනුම බෙදා ගැනීමට සහ නව නිපැයුම් බිහි කිරීම සඳහා වන භාෂාව සන්නිවේදනයේ ප්‍රධාන මෙවලම ලෙස සැලකේ.

භාෂා එකකට වඩා වැඩි ප්‍රමාණයක් ඉගෙනීමෙන් ඵලදායී සන්නිවේදනයක් ඇති කළ හැකි අතර එය සාජුවම වර්තමාන ලෝකයේ අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට දායක වේ.

බොහෝ ආයතන අද වන විට ගෝලීයකරණය වී ඇති බව සියලුදෙනා දන්නා කාරණයකි. එම ආයතනවල බහුභාෂා ඥානයෙන් පිරිපුන් පුද්ගලයින්ට විශාල ඉල්ලුමක් පවතින අතර එම ඉල්ලුමත් සමඟ එම ආයතන ඉදිරියට යන බව අප වටහා ගත යුතුය.

අපගේ ප්‍රධාන අරමුණ වන්නේ නවීන අධ්‍යාපනික පහසුකම් ඔස්සේ බහු භාෂා ඉගෙනීමේ අවස්ථාව අත්පත් කර ගැනීමට කැමති අය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමයි. පුහුණුලාභීන්ගේ තෘප්තිය, වගවීම, විශිෂ්ටත්වය සහ නව්‍ය තාක්ෂණය භාවිතය සඳහා වූ කැපවීම අපගේ සමස්ත සාර්ථකත්වයේ මෙහෙයුම්කරුවන් බවට පත්ව ඇත.



අපි අපගේ ඉගැන්වීම් ක්‍රමවේදයේ ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගනිමින් ඕනෑම අවස්ථාවක පුහුණුලාභීන්ගේ අභිලාෂයන් සම්පූර්ණ කිරීමට දක්ෂ වෘත්තිකයන් සහ කාර්යමණ්ඩලයක් යොදවන්නෙමු.

ඕනෑම ආයතනයක නිවැරදි මූල්‍ය වාර්තාවක් පවත්වා ගැනීම, එම ආයතනයේ සාර්ථකත්වයට පිටුබලයක් වන බව අපි තරයේ විශ්වාස කරමු. එබැවින්, අපි සෑම විටම නිවැරදි මූල්‍ය ප්‍රතිඵල සහතික කරන අතර ඉදිරි දැක්මක් සහිත මූල්‍ය සැලසුම්වලට සමපාත වන සම්පූර්ණ ක්‍රියාකාරී සැලසුමක් සපයනු ලැබේ.

අපගේ ආයතනය මිලියන 162ක අදායමක් සාර්ථකව උපයාගෙන ඇති බව ප්‍රකාශ කිරීමට හැකිවීම, පිලිබඳ අපි ආඩම්බර වෙමු. එසේම, එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂය අවසන් වන විට ස්වයං මූල්‍යයන ආයතනයක් බවට පත්වීමට උපායශීලී ලෙස සැලසුම් කරමින් සිටිමු.

ආයතනයට ගැළපෙන නිසි අයවැය ඇස්තමේන්තු ක්‍රමවේදයක් අනුගමනය කිරීම හා ඕනෑම කෙනෙකුට තමන්ගේ ආයතනයේ අනාගතය පිළිබඳ පුරෝකථන සැපයීම සඳහා අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන අතර එමගින් තමන් අවබෝධකරගත් මූල්‍ය ප්‍රතිඵල කාර්යක්ෂම ලෙස ළඟා කර ගැනීමට මං පෙත් විවර වේ.

අපේ කතාවේ වැදගත් පාර්ශව ලෙස, මෙම සාර්ථකත්වය උදෙසා අප සමඟ අත්වැල් බැඳගත් සියලු දෙනාට අපගේ කෘතවේදීත්වය පළ කර සිටිමු.

ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද
සභාපති



කළමනාකරණ මණ්ඩලය

ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා
සභාපති

අනුරාධ විජේකෝන් මහතා
අතිරේක ලේකම් -
රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ සහ ජාතික භාෂා
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

කේ.ඩී.අයි.එස්.කේ.සිරිවර්ධන මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ -
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

දිනුක් හෙට්ටිආරච්චි මහතා
වරලත් ගණකාධිකාරී

ආචාර්ය ඩබ්.කේ. කොලඹගේ
සභාපති - වෙල්ෆෝට් සමාගම් සමූහය

විදුර්සන් වින්සෙන් රාජා මහතා

එන්. පී. එස්. එච්. එම්. නුෂාඩ් මහතා

ආචාර්ය ප්‍රසාත් ආර්. හේරත්
අධ්‍යක්ෂ ජනරාල් - මණ්ඩලයේ ලේකම්

අධ්‍යයන මණ්ඩලය

ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා
සභාපති

ආචාර්ය සඳගෝමි කෝපරහේවා මහතා
අංශ ප්‍රධානි - සිංහල භාෂා අංශය
කොළඹ විශ්ව විද්‍යාලය

ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල
අංශ ප්‍රධානි - සිංහල භාෂා හා ජනසන්නිවේදන අංශය
මානව හා සමාජ විද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ආචාර්ය කේ. ඕ. ඩී. එස්. කරුණානායක
අංශ ප්‍රධානි - ඉංග්‍රීසි අංශය- ශාස්ත්‍ර පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය එම්. ඒ. එෆ්.සාධියා
අංශ ප්‍රධානි - භාෂා අංශය
ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය
අග්නි දිග විශ්වවිද්‍යාලය

ආචාර්ය එස්. ප්‍රසාන්තන්
අංශ ප්‍රධානි - දෙමළ අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය පී. එන්. රත්නායක
අංශ ප්‍රධානි - ඉංග්‍රීසි සහ භාෂාමය අංශය
මානව හා සමාජ විද්‍යා පීඨය
රුහුණු විශ්වවිද්‍යාලය

පී. සේනාධීර මහතා
කොමසාරිස් ජනරාල්
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

ආචාර්ය ප්‍රසාත් ආර්. හේරත්
අධ්‍යක්ෂ ජනරාල් - මණ්ඩලයේ ලේකම්

අපගේ අරමුණු

උත්පාදනය කිරීමට ....


සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක්ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීම;

ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තක සේවයෙන් පත්කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුනතාවයන් ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් බිහිකිරීම;

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරු බිහිකිරීම;

මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාවැති තැනැත්තන් පුහුණු කිරීම.

සංහිඳියාවේ කෙමිබිම



NILET ගැන...

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත යටතේ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ව්‍යවස්ථාපිත ආයතනය ලෙස ස්ථාපිත කරන ලදී.

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ ප්‍රධාන කාර්යාලය 321/1/1 හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය යන ස්ථානයේ ක්‍රියාත්මක වේ. භාෂා පාඨමාලා සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සියලුම අමාත්‍යාංශ හා ආයතන සමඟ කාර්යක්ෂම සම්බන්ධතාවක් ඇති කරගැනීම මඟින් එම අමාත්‍යාංශ හා ආයතන වලට අදාලව නිර්මාණය කර ඇති විවිධ පාඨමාලා සඳහා පහසුකම් සැපයීම ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ දෙවන භාෂා ප්‍රවීණතාවය ඉහළ සපුරාලීම සඳහා අංක 18/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව දෙවන භාෂා පුහුණු පාඨමාලාවලට අදාළ සියලු කටයුතු මෙම ආයතනය විසින් සිදු කරනු ලබයි.

අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ පුහුණු මධ්‍යස්ථානය කළුතර දිස්ත්‍රික්කයේ කොළඹ සිට කිලෝමීටර් 100ක් පමණ දුරින් පිහිටි ගලේවත්ත, අගලවත්ත ප්‍රදේශයේ පිහිටා ඇත. ජාතික වැවිලි හා කළමනාකරණ අමාත්‍යාංශයට අයත්ව තිබූ අක්කර 2.5ක භූමි ප්‍රමාණය කැබිනට් තීරණයක් මත ආයතනයට පවරා ඇති අතර මෙම ඉඩමේ පරිසරය ආයතනයේ සංවර්ධනයට වඩාත් ප්‍රබල සාධකයක් වී ඇත. භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලිය වඩාත් සෞන්දර්යාත්මකව, ප්‍රායෝගිකව සහ බුද්ධිමය ආකාරයෙන් සිදු කළ හැකි මනරම් පරිසරයක සහ මනස්කාන්ත භූ දර්ශනයක නේවාසික පහසුකම් සහිතව අගලවත්ත භාෂා මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇති

දඹුල්ල පුහුණු මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය අංක 734/1, අනුරාධපුර පාර, දඹුල්ල යන ස්ථානයේ දෙවන භාෂා සහ විදේශීය භාෂා ඉගැන්වීමට පහසුකම් සැලසීමේ අරමුණින් උගත් පාඩම් පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ අනුව මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. එය 2020.07.24 දින රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාගේ මඟපෙන්වීම යටතෙ විවෘත කරන ලදී. දැනට එය දඹුල්ල ගම්උදාව පරිපාලන සංකීර්ණයේ පිහිටා ඇත.

මෙම මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ (සැලසුම්) අධීක්ෂණය යටතේ සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා ඇත.

මෙම මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් මාතලේ, මහනුවර, නුවරඑළිය, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාව සඳහා භාෂා පුහුණු පාඨමාලා කාර්යක්ෂමව ක්‍රියාත්මක කරයි. ඉහත දිස්ත්‍රික්කවල කේන්ද්‍රස්ථානය වන දඹුල්ල ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ආයතනය අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා ද සිය සේවාව සපයයි.

කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු තීරණ ගනු ලබන්නේ ගරු අමාත්‍යවරයා විසින් පත් කරන ලද කළමනාකරණ මණ්ඩලය විසිනි. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2007 අංක 26 දරන පනතේ 3 (1) වගන්තියට අනුව ගරු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව කළමනාකරණ මණ්ඩලය පත්කර ඇත. 2022 වසරේ පැවති කළමනාකරණ මණ්ඩලයේ මුළු රැස්වීමේ සංඛ්‍යාව හතරක් (04) කි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යයන මණ්ඩලය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ 2007 අංක 26 දරන පනතේ 7 වැනි වගන්තිය අනුව ආයතනයේ අධ්‍යයන කාර්යයට සහාය වීමට සහ ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් කටයුතු කාර්යක්ෂම ඉටු කිරීම සඳහා ගරු අමාත්‍යතුමා විසින් පහත අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් පත් කර ඇත. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ විවිධ විශ්වවිද්‍යාලවල භාෂා සහ අධ්‍යාපන අංශ නියෝජනය කරන, විශ්වවිද්‍යාලවල ඉගෙනුම් ක්‍රියාවලිය මෙහෙයවන ආචාර්යවරුන් සහ මහාචාර්යවරුන් ගෙන් සමන්විත අධ්‍යයන මණ්ඩලය ආයතනයේ භාෂාමය ප්‍රතිපත්ති තීරණ ගැනීමට සෘජුවම බැඳී සිටී.
පනතේ විධානයන්ට අනුව අධ්‍යයන මණ්ඩලයේ ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අදාළ ඇතැම් කරුණු සම්බන්ධයෙන් ආයතනයට උපදෙස් දිය යුතු අතර අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කළ යුතුවේ.

ආයතනයේ කාර්ය මණ්ඩලය

ආයතනික කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර කළමනාකරණ මණ්ඩලයේ විධිවිධානයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා පහත සඳහන් රාජකාරී ඉටු කරයි - ආයතනයේ පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම් ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය පත් කිරීම සහ අඩු කිරීම්, ආයතනය විසින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය, පරිපාලන හා ආයතනික කටයුතු අධීක්ෂණය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලබයි.

පරිපාලන හා සැපයුම් අංශය

ආයතනයට අදාළ සියලුම පරිපාලන හා ආයතනික කටයුතු මෙම අංශය මගින් සිදු කරයි. ආයතනයේ අනෙකුත් අංශවල කාර්යයන් බාධාවකින් තොරව ඉටු කිරීමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සපයා දෙමින් අංශ අතර සම්බන්ධීකරණය කිරීමේ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

තවද, අනෙකුත් අංශවලට අවශ්‍ය නව බඳවාගැනීම් සිදු කරන අතරම විවිධ අංශවල කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමට සහ සේවකයන්ගේ සුබසාධනය මෙන්ම සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීමටද මෙම අංශය කටයුතු කර ඇත. පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය සහ සියලුම අංශ සඳහා අවශ්‍ය පරිගණක සහ කාර්යාල උපකරණ සහ ලිපි ද්‍රව්‍ය මෙම අංශය මගින් මිලදී ගන්නා අතර වාහන නඩත්තුව, ප්‍රවාහන පහසුකම් ආරක්ෂක සේවා සහ පිරිසිදු කිරීමේ සේවාවන්ද මෙම අංශය මගින් සිදුකරන බව සඳහන් කළ යුතුය. පුස්තකාල හා ලේඛන සේවා ද මෙම අංශය මගින් පවත්වාගෙන යනු ලැබේ.

පුහුණු අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාවට යහපත් යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා ජාතීන් අතර සහජීවනය ඇති කරමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ආයතනයේ ඉලක්ක යථාර්ථයක් බවට පත් කිරීමට පුහුණු අංශය ප්‍රධාන දායකත්වය ලබා දෙයි

ඒ අනුව, පාඨමාලා ලැයිස්තුගත කිරීමේ සිට ඒ යටතේ ඇති ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වන කාර්යක්ෂම රාජ්‍ය සේවය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ දෙවන භාෂාව සපුරාලීම සඳහා 18/2020 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව දෙවන භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම සම්බන්ධ සියලු කටයුතු මෙම අංශය විසින් සිදු කරනු ලබයි.
පුහුණු අංශය විසින් ප්‍රධාන වශයෙන් රාජ්‍ය නිලධාරීන් සඳහා කාණ්ඩ 3ක් යටතේ දෙවන භාෂා පුහුණු පාඨමාලා සංවිධානය කර ඇති අතර, වැඩසටහන පහත පරිදි ක්‍රියාත්මක වේ.

1. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැය 200 ක
2. ද්විතීක කාණ්ඩයේ නිලධාරීන් සඳහා පැය 150 ක
3. ප්‍රාථමික කාණ්ඩයේ නිලධාරීන් සඳහා පැය 100ක

දෙවන භාෂා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

භාෂා පුහුණු පාඨමාලා දිගටම කරගෙන යාමට අවශ්‍ය ක්‍රමවේද යොදා ගනිමින් පුහුණු පාඨමාලා සම්බන්ධ විධිමත් අධීක්ෂණය සහ රෙගුලාසි පවත්වාගෙන යාමට ඉහත සියලුම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ. එසේම නියමිත පුහුණු පාඨමාලා සඳහා සම්පත් දායක සංචිතය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම මෙම අංශයේ වැදගත් කාර්යභාරයකි. ආයතනික අරමුණු වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ද පුහුණු අංශය මගින් සංවිධානය කරනු ලැබේ.

රජයේ නිලධාරීන් සඳහා අර්ධකාලීන පාඨමාලා පැවැත්වීම, ගුරු පුහුණු පාඨමාලා පැවැත්වීම, නිරීක්ෂණ සහ පසු විපරම් පාඨමාලා පැවැත්වීම, පූර්ණ කාලීන පාඨමාලා සඳහා විධිමත් ඇගයීම් පැවැත්වීම.

ආයතනයේ පුහුණු අංශය මගින් ආදායම් උත්පාදන පාඨමාලා ද පවත්වනු ලැබේ. ඒවා නම් දෙවන භාෂා (සිංහල/දෙමළ) භාෂා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම, දෙවන භාෂා ඉගැන්වීමේ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම, පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම, විශේෂ වෘත්තීන් සඳහා දෙවන භාෂා පාඨමාලා පැවැත්වීම, ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම, විදේශ භාෂා පාඨමාලා පැවැත්වීම, සංඥා භාෂා පාඨමාලා පැවැත්වීමයි.

වමෙන්ම පුහුණු වැඩසටහන්වලට අදාළ සියලුම ක්‍රියාකාරකම් සිදු කරන අතරම ශීඝ්‍රයෙන් වෙනස් වන නව ලෝකයක අවශ්‍යතාවලට සරිලන පරිදි පුහුණු පාඨමාලා යාවත්කාලීන කිරීම සහ සංවිධානය කිරීම පිළිබඳව පුහුණු අංශය නිරන්තර අවධානය යොමු කරයි.

සැලසුම් අංශය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ සඳහන් ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මෙම අංශයේ මූලික වගකීමක් වේ.

මෙම අංශයේ කාර්යයන් අතර පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, සංයුක්ත සැලසුම් සකස් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ගිණුම් අංශය හා සම්බන්ධ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මාසික සැලැස්මක් සැකසීම යනාදිය ඇතුළත් වේ. තවද, මාසික, කාර්තුමය සහ වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කර අදාළ අංශ වෙත යැවීමද සැලසුම් අංශය මගින් සිදුකරයි.

විවිධ ව්‍යාපෘති මගින් සිදුකරන වැඩසටහන්වලට අදාළ සැලසුම් සකස් කිරීම සහ ඒවායේ ප්‍රගති වාර්තාව සකස් කිරීම ද මෙම අංශය මගින් සිදු කෙරේ. සැලසුම් සහකාර අධ්‍යක්ෂවරයා මෙම අංශයේ ප්‍රධානියා වන අතර සම්බන්ධීකරණ සහකාරවරයකු ඊට අනුයුක්ත කර ඇත.

ගිණුම් අංශය

ආයතනයේ සියලුම මූල්‍ය පරිපාලන සහ ගිණුම් කටයුතු සඳහා ගිණුම් අංශය වගකීම දරයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන මූල්‍ය විධායක නිලධාරියා වන අතර ගණකාධිකාරිවරයා මූල්‍ය පරිපාලනය සහ ගිණුම් ගනුදෙනු සඳහා වගකිව යුතු පුද්ගලයා වේ. ගණකාධිකාරිවරයා මෙම අංශයේ ප්‍රධානියා වන අතර කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු මෙම අංශයට අනුයුක්ත කර ඇත.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය ස්වාධීන වන අතර අරමුණු සහ උපදේශන ක්‍රියාකාරිත්වය තුළින් ආයතනයේ මෙහෙයුම් සඳහා වටිනාකමක් එක් කරයි. ආයතනයේ දත්ත විශ්ලේෂණය සහ ක්‍රියාවලිය මත පදනම්ව නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීමෙන් ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට සහාය වන අවදානම් කළමනාකරණය, පාලන, වැඩිදියුණු කිරීම් සහ ඵලදායිතාව තුළින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය තුළ ක්‍රමානුකූල සහ විනයානුකූල ක්‍රමවේදය භාවිත කරයි.

අභ්‍යන්තර විගණන ඒකකය යනු ආයතනයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සහ අගය එකතු කිරීම සඳහා නිර්මාණය කර ඇති ස්වාධීන අරමුණු සහ උපදේශන ක්‍රියාකාරකම් මෙහෙයවන අංශයයි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ සම්පත් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට සහ ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පරිපාලනයට සහාය වීම අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය වේ.

2022 වසර සඳහා ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තාව පහත පරිදි වේ.

1. දඹුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පැවැත්වෙන ආදායම් උත්පාදන වැඩසටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන සමාලෝචනය.

2. අගලවත්ත පුහුණු මධ්‍යස්ථානයේ පැවති ආදායම් උත්පාදන නේවාසික වැඩසටහනේ අභ්‍යන්තර විගණන සමාලෝචනය.

3. ප්‍රාග්ධන ප්‍රදාන යටතේ පවත්වනු ලබන භාෂා පුහුණු වැඩසටහන් වල අභ්‍යන්තර විගණන සමාලෝචනය.

4. ආරක්ෂක සේවා සහ ඇමතුම් සේවා පිළිබඳ අභ්‍යන්තර විගණන සමාලෝචනය.

5. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 4/2022 අනුව වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය.

6. ගිවිසුම්ගත සේවාවන් නඩත්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව.

7. වාහන භාවිතය සහ පරිපාලනය පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂාව.

8. ජාතික භාෂා හා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ ආදායම් උත්පාදන වැඩසටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන සමාලෝචනය.



භාෂාමය සීමා මායිම් මායිම් නොකර භාෂාවෙන් බොහෝ වැඩ ගන්නා NILET

ගෝලීය ප්‍රවීණතා දෙසට යොමු වූ NILET හි ගමන් මග

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් රාජ්‍ය සේවය තුළ ඵලදායී සන්නිවේදනයේ වැදගත්කම හඳුනාගෙන ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉතා සූක්ෂ්ම ලෙස සැලසුම් කරන ලද දෙවන භාෂා පුහුණු පාඨමාලා මගින් රාජ්‍ය නිලධාරීන්ගේ දෙවන භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා ඇප කැප වී ක්‍රියා කරයි. එමෙන්ම මෙම පාඨමාලා මගින් දෙවන භාෂා ප්‍රවීණතාවය ඉහළ නැංවීමට සහ භාෂාමය රික්තක පිරවීමට මූලික අඩිතාලමක් ලෙස ක්‍රියාකරනු ලබයි.

18/2020 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පවත්වනු ලබන දෙවන භාෂා (දෙමළ / සිංහල) පුහුණු පාඨමාලා.

- රාජ්‍ය නිලධාරීන් සඳහා වන , පැය 200 නේවාසික / නේවාසික නොවන දෙවන භාෂා (දෙමළ / සිංහල) පුහුණු පාඨමාලා
- පැය 150 නේවාසික / නේවාසික නොවන දෙවන භාෂා (දෙමළ / සිංහල) පුහුණු පාඨමාලා
- පැය 100 නේවාසික / නේවාසික නොවන දෙවන භාෂා (දෙමළ / සිංහල) පුහුණු පාඨමාලා

මෙම දෙවන භාෂා පුහුණු පාඨමාලා මගින් රාජ්‍ය නිලධාරීන්ගේ සන්නිවේදන බාධක මඟ හැරීමට, අන්තර් සංස්කෘතික අවබෝධය වර්ධනය කිරීමට සහ වඩාත් ඵලදායී රාජ්‍ය පාලනයක් සඳහා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සැපයීමට රාජ්‍ය නිලධාරීන් සවිබල ගන්වනු ලබයි.
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් ඉහත සඳහන් පාඨමාලාවලට අමතරව පහත දැක්වෙන පාඨමාලාද ක්‍රියාත්මක කරනු ලබයි.

ගුරු පුහුණු පාඨමාලා

- දින 05 නේවාසික ගුරු පුහුණු පාඨමාලාව
- මාර්ගගත ගුරු පුහුණු පාඨමාලාව

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ භාෂා අධ්‍යාපනය සම්බන්ධ පාඨමාලා මෙන්ම ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, ඉගැන්වීම් කාර්යේදී අධ්‍යාපනඥයාගේ ප්‍රධාන භූමිකාව හඳුනාගෙන ඇති අතර ඒ අනුව ඉහත පුහුණු පාඨමාලා ඔස්සේ භාෂා ගුරුවරුන් මූලික අධ්‍යාපන කුසලතාවලින් සන්නද්ධ කිරීමට කටයුතු කරනු ලබයි. එමගින් භාෂා ගුරුවරුන් ලෙස වඩාත් ඵලදායී ලෙස භාෂා ඉගැන්වීම් කටයුතු සිදුකිරීමට එම පුහුණුකරුවන් සතු සූදානම සහතික කරනු ලබයි.

සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා.

- සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාව
- බ්‍රේල් භාෂා සහතික පත්‍ර පාඨමාලාව
- ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව.
- හින්දි භාෂා සහතික පත්‍ර පාඨමාලාව
- කොරියානු භාෂා සහතික පත්‍ර පාඨමාලාව
- ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාව
- ප්‍රංශ භාෂා සහතික පත්‍ර පාඨමාලාව
- දෙවන භාෂා ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාව
- පරිවර්තන ඩිප්ලෝමාව
- හින්දි භාෂා ඩිප්ලෝමාව
- දෙවන භාෂා දෙමළ/සිංහල ඩිප්ලෝමා පාඨමාලාව.

මීට අමතරව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් පුද්ගලයන්ගේ සහ වෘත්තිකයන්ගේ භාෂා අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද විවිධ සහතිකපත්‍ර හා ඩිප්ලොමා පාඨමාලා පිරිනමනු ලබයි.

වර්තමානයේදී සිෂ්‍රයෙන් විතැන් වන ගෝලීය ලෝකය තුළ මෙවැනි වැඩසටහන් බෙහෙවින් වැදගත් වන අතර එම වැඩසටහන් පුද්ගල සහ වෘත්තීය පරිවර්තන සඳහා උත්ප්‍රේරක ලෙස ක්‍රියා කරයි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් ප්‍රදානය කරනු ලබන සියලුම පාඨමාලාවල මූලික හරය වන්නේ දේශීය සහ විදේශීය භාෂා ප්‍රවීණතාව ලබා දීම වන අතර එය විශ්වීය සන්නිවේදනයේ දොරගුළු විවර කිරීමට මහත්සේ උපකාරී වෙයි.

මෙම වැඩසටහන් ඉංග්‍රීසි සහ ප්‍රංශ වැනි ලොව බහුලව ප්‍රචලිත භාෂාවන්ගේ සිට සංඥා සහ බ්‍රේල් වැනි විශේෂ අනුකලන භාෂා ඉගැන්වීම දක්වා පුළුල් පරාසයක විහිදෙන අතර එය විවිධ භාෂා පිළිබඳ ප්‍රවීණයන් වීමට සුදුසු කුසලතාවලින් හෙබි පුද්ගලයන් වීමට පාඨමාලාලාභීන් සවිබල ගන්වනු ලබයි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු_ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ භාෂා පාඨමාලා ජාත්‍යන්තර ව්‍යාපාර, රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රවල දක්නට ලැබෙන සංකීර්ණතා සමඟ කටයුතු කිරීමට පුද්ගලයන්ව සූදානම් කරයි. මෙම පාඨමාලා ඔස්සේ ලබාගන්නා භාෂා ප්‍රවීණතාවයෙන් විදේශ අධ්‍යාපනය, වෘත්තීය සහ සංස්කෘතික අවස්ථා උදාවේ.

සංඥා සහ බ්‍රේල් භාෂා සඳහා වෙන්වූ පාඨමාලාවලින් විද්‍යමාන වන්නේ මෙම ආයතනය අනුකලන අධ්‍යාපනය දෙසට ඇති උනන්දුව හා කැපවීම වන අතර මෙම පාඨමාලා ශ්‍රවණ හා දෘශ්‍යාබාධිත පුද්ගලයන් සමඟ ඇති සන්නිවේදන පරතරයන් අවම කර සම්පූර්ණ සමාජ අනුකලනයක් සහතික කිරීමට සඳහා මෙම භාෂා අත්‍යවශ්‍ය වේ.

මෙම භාෂා ප්‍රවීණතා වැඩසටහන් හුදු ඉගෙනුම් ක්‍රියාවලියකට වඩා ගැඹුරු භාෂාමය අත්දැකීම් ලබා දෙන පාඨමාලා වේ. තවද පාඨමාලාලාභීන් විවිධ භාෂාමය පරිසරවල කටයුතු කිරීමට එලදායී සන්නිවේදනය ඔස්සේ අන්තර් සංස්කෘතික අවබෝධය පෝෂණය කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා දේ. මේ අනුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා මඟින් සාමාන්‍ය සහ වෘත්තීය ප්‍රජාවට අන්තර් සම්බන්ධිකරණ බහු භාෂාමය ලෝකයක කටයුතු කිරීමේ හැකියාව ලැබේ. තවද මෙම පාඨමාලා ඔස්සේ පාඨමාලාලාභීන්හට සංස්කෘතික අවබෝධය සහ ප්‍රවර්ධනය ලැබෙන අතර අධ්‍යයන හා වෘත්තීය වාසි උදා කර ගත හැකිය.

අපේ සිසුන් කියන කථා



මම මුලින්ම මෙම භාෂා පාඨමාලාවට සම්බන්ධ වුනේ උසස්වීම් සහ වැටුප් වර්ධක සඳහා අවශ්‍ය වෘත්තීය අවශ්‍යතා සපුරාලීම සඳහාය. කෙසේ වෙතත්, වැඩසටහන හරහා ප්‍රගතියට පත් වූ මම මින් පෙර කිසිදා අත්විඳ නැති දෙමළ භාෂාව පිළිබඳ නව අගයක් සහ ආදරයක් සොයා ගතිමි. භාෂාව ඉගෙනීම වෘත්තීයමය වශයෙන් ප්‍රයෝජනවත් පමණක් නොව පුද්ගලිකව ද ප්‍රතිලාභ ගෙන දෙයි.

NILET දෙවන භාෂා පාඨමාලාව රාජ්‍ය නිලධාරියෙකු ලෙස මට ඇදහිය නොහැකි තරම් ඵලදායී අත්දැකීමක් වූ බව කිව යුතුය. මෙම පාඨමාලාවේ භාවිතා කරන පුහුණු ක්‍රමවේදය සුවිශේෂී වන්නේ එය භාෂාව සහ සංස්කෘතිය ඵලදායී ලෙස බද්ධ කරන බැවිනි. මෙම අද්විතීය කාර්යාලය මගේ භාෂා කුසලතා ගැඹුරු කළා පමණක් නොව. භාෂාව හා බැඳුණු සංස්කෘතියට ගැඹුරු සම්බන්ධයක් ඇති කළේය.

භාෂාව සන්නිවේදනය සඳහා මෙවලමක් පමණක් නොව විවිධ සංස්කෘතීන් අවබෝධකර ගැනීමට සහ ගරු කිරීමට දොරටුවක් බව මම තේරුම් ගතිමි. මගේ දෙපාර්තුමේන්තුව සහ පුළුල් ප්‍රජාව තුළ ඇති හිඩැස් පියවීමට, සබඳතා ගොඩනඟා ගැනීමට සහ සංස්කෘතික විවිධත්වය සහ ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීමට සිංහල භාෂාව පිළිබඳ මගේ ප්‍රවීණතාවය භාවිතා කිරීමට මම බලාපොරොත්තු වෙමි.

අපගේ පාඨමාලා


NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING
Ministry of Public Services, Provincial Councils and Local Government
ONLINE
Certificate Course in Hindi
It's never too early to learn a new language
NILET
Short Term English Programme (STEP)
Basics of English Language for Beginners
STEP Coverage
Vocabulary Building
Basic Grammar
Sentence Formation
Basic Spoken Styles
Group Activities
Overcome English Phobia
Translation
Writing Skills
Target Group
NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ONLINE
Certificate Course in Korean
It's never too early to learn a new language
Learn Korean
NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING
The Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ONLINE CERTIFICATE COURSES
IT'S NEVER TOO EARLY TO Learn a new language!
FRENCH
KOREAN
JAPANESE
120 HRS. ACCORDING TO SLQF
02 WEEK SESSIONS
EMINENT UNIVERSITY LECTURERS
Hurry up
Email your CV on or before 26th July
NILET
For Inquiries and Concerns
070 - 400 0019 / nilettraining21@gmail.com
NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ONLINE
Certificate Course in French
It's never too early to learn a new language
Learn French!
NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ONLINE
Certificate Course in Japanese
It's never too early to learn a new language
Learn Japanese

විෂයමාලා සංවර්ධනය

ඉංග්‍රීසි, හින්දි, කොරියානු, ජපන් සහ ප්‍රංශ භාෂා විෂයමාලා සංවර්ධනය කිරීම.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය ලංකාවේ සාමාන්‍ය ජනතාව අතර සන්නිවේදන කුසලතා වර්ධනය කරන භාෂා ප්‍රවීණතාව, පෞරුෂ වර්ධනය, සංස්කෘතික අවබෝධය සහ ආර්ථික සංවර්ධනය අරමුණු කරයි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය ඉංග්‍රීසි, හින්දි, කොරියානු, ජපන් සහ ප්‍රංශ භාෂා සඳහා විෂයමාලා සංවර්ධනය කරමින් දේශීය භාෂාවලින් ඔබ්බට යමින් සන්නිවේදන කුසලතා පුළුල් කිරීමේ කාලීන අවශ්‍යතා හඳුනා ගනිමින් ඒ සඳහා ප්‍රතිකාර්ය පිළියමක් ගෙන ඇත. මෙහිදී අපගේ අරමුණ වූයේ ගෝලීයකරණය වූ ලෝකයක ඵලදායී ලෙස සම්බන්ධතා පැවැත්වීමට පුද්ගලයන් සවිබල ගැන්වීමයි.

මෙම කාර්යේදී ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් හින්දි (2021- 2020), ප්‍රංශ (2022 - 2023) භාෂා සහතිකපත්‍ර පාඨමාලා සාර්ථකව සංවිධානය කරන ලදි. එම පාඨමාලා භාෂා අධ්‍යයනය පමණක් නොව සියුම් සංස්කෘතික කරුණුද අවධාරණය කරන ලද අතර එමගින් මෙම භාෂා හා සම්බන්ධ අන්‍ය සංස්කෘතීන් පිළිබඳ ගැඹුරු ඇගයීමක් ඇති කරයි. මෙම පාඨමාලා සඳහා ආයතනය වෙත ධනාත්මක ප්‍රතිචාර ලැබෙන අතර පාඨමාලාලාභීහු මෙවැනි අවස්ථා උදා කර දීම පිළිබඳ ඔවුන්ගේ කෘතඥතාව පළ කරයි.

ඵලදායී සන්නිවේදනය පුද්ගලයකු සතු විය යුතු වත්කමක් වන බැවින් භාෂාව සම්බන්ද මෙවැනි පාඨමාලා විවිධ පසුබිම් සහ වෘත්තීන් නියෝජනය කරන පුද්ගලයන්ගේ කාර්යයන් වඩාත් කාර්යක්ෂම කරනු ලබයි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, ශ්‍රී ලංකාවේ ගතික භාෂාමය ස්වරූපය පිළිබිඹු කරමින් වෙනත් විදේශීය භාෂා සඳහා විෂයමාලා නිර්මාණය කිරීමට කටයුතු කරමින් සිටියි. මෙම ප්‍රයත්නය ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට සහ භාෂා ප්‍රවීණතාව, බාධාවක් නොවූ පුද්ගලික හා සමාජීය ප්‍රගමනයට පාලමක් වන පරිසරයක් නිර්මාණය කිරීමට දායක වනු ඇත.

එපමණක්ද නොව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, බැංකු කාර්යමණ්ඩල වැනි විවිධ කණ්ඩායම් සඳහා විශේෂිත ඉංග්‍රීසි පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ එම ආයතනවල සුවිශේෂී භාෂා අවශ්‍යතා සපුරාලීම සඳහා වන අතර සහභාගීවන්නන්ගේ වෘත්තීය පරාස තුළ ඵලදායී සන්නිවේදනය සඳහා අවශ්‍ය නවීන භාෂා කුසලතා ලබා ගැනීමට හැකි වන පරිදිය.

මෙම ආයතනය විවිධ කණ්ඩායම්වල අවශ්‍යතාවලට ගැළපෙන ඉංගීසි වැඩසටහන් සංවිධානය කිරීමට සමත්වී ඇත. ඕනෑම ආයතනික ව්‍යුහයක සන්නිවේදන ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා භාෂා ප්‍රවීණතාව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බව අපි දනිමු. එබැවින් වෘත්තීය අවශ්‍යතාවලට සරිලන පරිද්‍ද නම්‍යශීලී වෙමින් ඉංග්‍රීසි පුහුණු වැඩසටහන් අදාළ පිරිසේ භූමිකා සහ වගකීම් සමඟ සමපාත වන ආකාරයට ප්‍රායෝගික භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා සකස් කර ඇත.

සාමාන්‍ය ජනතාවට නව අවස්ථා සඳහා දොරටු විවිධ කරමින් භාෂා පාඨමාලා පිරිනැමීම තව දුරටත් වර්ධනය කිරීමට අප බලාපොරොත්තු වෙමු. ඉදිරි පාඨමාලා ප්‍රායෝගික සන්නිවේදන කුසලතා සංස්කෘතික දැනුම්වත්භාවය සහ පෞරුෂ වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් නිර්මාණය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි භාෂා පාඨමාලා මගින් ගෝලීය ලෙස ඵලදායීව සන්නිවේදනය කිරීමට පුද්ගලයින්ට හැකියාව ලබා දෙන බව සඳහන් කළ යුතුය. එමගින් අප ආයතනයක් ලෙස සමාජයේ සමස්ත සංවර්ධනයට දායක වන බව පෙන්වා දිය හැකිය. එමගින් අප ආයතනයක් ලෙස සමාජයේ සමස්ත සංවර්ධනයට දායක වන බව පෙන්වා දිය හැකිය.

සංඥා භාෂා සහතිකපත්‍ර පාඨමාලාව



ශ්‍රවණාබාධ සහ කථනාබාද සහිත පුද්ගලයන් සඳහා නිල සහ විධිමත් සන්නිවේදන මාධ්‍යයක් ලෙස සංඥා භාෂාව සඳහා ඇති ඉල්ලුමට ප්‍රතිචාරයක් වශයෙන් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පුරෝගාමී වී සංඥා භාෂා සහතිකපත්‍ර පාඨමාලාවක් හඳුන්වාදෙන ලදී. හිටපු ගරු අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා, ආයතනයේ සභාපති ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා සහ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාත් ආර්. හේරත් යන මහත්වරුන්ගේ මාර්ගෝපදේශකත්වය මඟින් ආරම්භ වූ මෙම වැඩසටහන සාම්ප්‍රදායික භාෂා අධ්‍යාපනයේ සීමාවෙන් ඔබබට ගොස් පවත්වන ලදී. එහි අරමුණ වූයේ භෞතික සීමාවන්ට යටත් පුද්ගලයන් අතර සන්නිවේදන බාධාවන්ට ආමන්ත්‍රණය කිරීම සහ අනුකලන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ සංඥා භාෂාවේ භූමිකාව අවධාරණය කිරීමයි.

2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවක් ලෙස නම් කරන ලද සංඥා භාෂාව ශ්‍රවණාබාධ සහ කථන දුබලතා ඇති ප්‍රජාව සඳහා මූලික සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිත වේ. එය වාචික ප්‍රකාශනයකින් තොරව සිතුවිලි සහ අදහස් ප්‍රකාශ කිරීම සඳහා මුද්‍රා සහ අභිනයන් ආශ්‍රයෙන් ක්‍රියාත්මක වන පද්ධතියක් මත රඳා පවතී. සමාජ සවිබල ගැන්වීම, සුබසාධන සහ උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යාලේඛන සලකා බැලීමේ සංඥා භාෂාවේ වැදගත්කම වඩා පැහැදිළි වේ. ශ්‍රී ලංකාවේ මිලියන 22 ක ජනගහනයෙන් ලක්ෂ 04 ක් පමණ විවිධ ශ්‍රවණාබාධවලින් පෙළෙන බව එම දත්ත පෙන්වා දෙයි. තවද මෙම සංඛ්‍යාව අබණ්ඩව ඉහළ යමින් පවතින බවද වාර්තා වේ.

ඉහත තත්ත්වය සලකා බලමින් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය සංඥා භාෂා සහතිකපත්‍ර පාඨමාලාවක් කෝවිඩ් - 19 වසංගතය හමුවේ වල්ලවී ඇති අභියෝග මධ්‍යයේ දියත් කරන ලදී. මෙම නවමු පියවර ගනු ලැබුවේ දුරස්ථ අධ්‍යාපනය ප්‍රයෝජනයට ගැනීමට සහ සෑම පුද්ගලයෙකුටම අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති අයිතිය සහතික කිරීම සඳහාය. 2021 වර්ෂයේ ජනවාරි 02 වන දින මෙම පාඨමාලාව ආරම්භ කරන ලද අතර වසංගත කාල සීමාව ප්‍රචලිතව පැවති සමයේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිවයිනේ බොහෝ ප්‍රදේශ නියෝජනය කරන පාඨමාලාලාභීනට සහභාගී වීමට පහසුකම් සැලසුණි.


ලංකාවේ සංඥා භාෂා ක්ෂේත්‍රයේ ප්‍රවීණ සම්පත්දායකයන් වන චම්මි ඩයස් මහත්මිය, චාමර විජේසිංහ මහතා සහ ජානක ගුණවර්ධන මහතාගේ සම්පත්දායකත්වය මෙම පාඨමාලාවේ සාර්ථකත්වයට හේතු විය. ඔවුන්ගේ මග පෙන්වීම සහ කැපවීම පාඨමාලාලාභීන්ගේ සංඥා භාෂා දැනුමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුනි.

2022 ජනවාරි දෙවන දින සිට දෙසැම්බර් 24 වන දින දක්වා වසරකට ආසන්න කාලයක් තුළ අන්තර් ක්‍රියාකාරී සැසි, දේශන සහ ප්‍රායෝගික අභ්‍යාස මාලාවකට සහභාගී වීමට පාඨමාලාලාභීන්ට අවස්ථාව ලැබුණි. එමගින් කථන සහ ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන් සමග ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට අවශ්‍ය ශක්‍යතාවලින් ඔවුන් පෝෂණය විය. මෙහිදී පාඨමාලාලාභීන් හා සම්පත්දායකයන් විසින් සමස්ත පාඨමාලාව වෙත දක්වන ලද උනන්දුව හා උද්යෝගය එහි සාර්ථකත්වයට දායක වූ බව කිව හැකිය.

මෙම පාඨමාලාව හැදෑරූ පාඨමාලාලාභීන්ගේ සුවිශේෂීත්වය වන්නේ ඔවුන් මෙම විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව වෙනුවෙන් සේවය කිරීමට සූදානම් වීමයි. සංඥා භාෂාව පිළිබඳ දැනුම ලබා ගැනීමෙන් මෙම පාඨමාලාලාභීන් ශ්‍රවණ හා කථන ආබාධ සහිත පුද්ගලයන් ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීමට මෙතෙක් බාධාවක්ව පැවති සන්නිවේදන පරතරය පියවම සඳහා අවශ්‍ය භාෂා ඥානය ලබා ඇත.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් ආරම්භ කරන ලද ඉහත විස්තර සඳහන් සංඥා භාෂා සහතිකපත්‍ර පාඨමාලාව, කථන හා ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන් ඵලදායී සන්නිවේදනය ඔස්සේ ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීමේ ඉලක්කය සපුරා ගැනීමට කටයුත්ත් කර ඇත. එමගින් ලංකාවේ ආර්ථික සංවර්ධන විභව්‍යතාව ඉහළ නැංවීම සිදු වනු ඇත

පාඨමාලාලාභීන් 34 දෙනෙකු කණ්ඩායම් දෙකක් ලෙස පුළුල් විෂය නිර්දේශයක් සැපයීමේ යටතේ මෙය ආරම්භ විය. එහි විෂය මාලාවට සංඥා භාෂාවේ මූලික කරුණු සන්නිවේදන ශිල්පීය ක්‍රම, සහ සංඥා භාෂා පරිවර්තකයන්ගේ ප්‍රධාන භූමිකාව ඇතුලු පුළුල් පරාසයක විහිදුනු විෂය මාතෘකා ඇතුළත් විය.



“සහභාගිත්වය තුළින් හෘදයාංගමව බැඳුණු ආවර්ජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය”





සහභාගිත්වය තුලින් හෘදයාංගමව බැඳුණු ආවර්ජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය PRH Methodology

භාෂා අධ්‍යාපන විශිෂ්ටත්වය කරා යන NILET හි ගමන් මග

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ ඵලදායී භාෂා අධ්‍යාපනය සඳහා ආයතනයේ ඇති නොසැලෙන කැපවීම; නව්‍යකරණයේ සහ ශිෂ්ටත්වයේ ගමනකට අපව යොමු කර ඇත. අපගේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ප්‍රසාත් ආර්. හේරත් මහතාගේ දුරදර්ශී නායකත්වය යටතේ ඉතා සූක්ෂ්ම ලෙස වර්ධනය කරන ලද පරිවර්තනීය ප්‍රවේශයක් වන PRH ක්‍රමවේදය, මෙම ගමනේ කේන්ද්‍රය වේ.

මෙම ක්‍රමවේදය සඳහා ආචාර්ය හේරත් මහතා යොමු වන්නේ විවිධ විශ්වවිද්‍යාල සහ අධ්‍යාපනික ආයතන මගින් පවත්වන ලද දෙවන භාෂා පුහුණු වැඩසටහන් නිරීක්ෂණය කිරීමෙන් ලද මාහැඟි පරිචයෙනි. කීර්තිමත් භාෂා අධ්‍යාපනඥයෙකු සහ පුහුණුකරුවකු ලෙස ඔහුගේ ගැඹුරු තීක්ෂණ බුද්ධිය සහ ප්‍රවීණතාව වැඩිහිටි භාෂා අධ්‍යාපනය නව මානයක් කරා යොමු කිරීමට සමත් විය. එහි ප්‍රතිඵලය වූයේ විනෝදාත්මක සහ හරවත් භාෂා ඉගෙනුම් අත්දැකීමක් ලබා දෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් නිර්මාණය වීමයි.

ඇන්රගොපි න්‍යාය භාවිත කරමින් නිර්මාණය කරන ලද මෙම ක්‍රමවේදය, PRH ක්‍රමවේදය සහ ඇන්රගොපි න්‍යායේ සංකලනයක් නියෝජණය කරන අතර එය භාෂා අධ්‍යාපනය හුදු ඉගෙනුමක්ය යන පදනම ඉක්මවා ගොස් එය විනෝදාත්මක අත්දැකීමක් බවට පත් කරයි.

PRH ක්‍රමවේදය; සංකල්ප අධ්‍යයනය, සමූහ අධ්‍යයනය, ආවර්ජනීය හා විමර්ශනාත්මත අධ්‍යයනය යන ප්‍රධාන කුලුණු 04 මත පිහිටා ඇති අතර මෙමගින් භාෂා අධ්‍යාපනයට මෙන්ම සංස්කෘතික අධ්‍යනයටද මග පෙන්වනු ලබයි.

සාම්ප්‍රදායික ඉගැන්වීමේ ප්‍රවේශය නව්‍යකරණයෙන් සිදු කර ඇති PRH ක්‍රමවේදය භාෂා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි හැරවුම් ලක්ෂයක් බවට පත්ව තිබේ. භාෂාව හුදු සන්නිවේදන මෙවළමකට එහා ගිය දෙයක් බව වටහා ගනින් එය සාමුහික ඥනය වර්ධනය කළ හැකි මෙවළක් ලෙස ක්‍රියාත්මක කළ හැකි බවයි මෙම ක්‍රමවේදය මගින් විද්‍යමාන වේ.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් මෙම ක්‍රමවේදයට අනුකූලව සම්පත්දායකයන් 3341 දෙනෙකු පුහුණු කර ඇති අතර ඔවුන් භාෂා උපදේශකයන් වශයෙන් පමණක් නොව සංස්කෘතික වාහකයන් ලෙසද කටයුතු කරන පිරිසකි.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සඳහා අනුගමනය කරන PRH ක්‍රමවේදය, ඵලදායී භාෂා අධ්‍යාපනය සහ අන්තර් සංස්කෘතික අවබෝධය පුළුල් කරන මෙවළමක් වන බැවින් එය බහු භාෂික ප්‍රජාවන් අතර අවබෝධාත්මක සංහිදියාව ප්‍රවර්ධනය කරනු ලබන සේතුවක් ලෙස ක්‍රියා කරනු ලබයි.



ආචාර්ය ප්‍රසාත් ආර්. හේරත්
අධ්‍යක්ෂ ජනරාල් - NILET
PRH ක්‍රමවේදයේ නිර්මාතෘ

භාෂා අධ්‍යාපනය පණගන්වන්නට....

කැනේඩියානු ව්‍යාපෘතිය NLEAP

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය (NILET) සිය වාර්ෂික වාර්තාව සාධම්බරයෙන් ඉදිරිපත් කරමින්, කැනඩා රජය විසින් නොමසුරුව සහාය දක්වන සැලකිය යුතු දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NLEAP) අවධාරණය කරයි. NLEAP හි NILET සමඟ ඇති හවුල්කාරිත්වය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය (OLP) ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කරන අතරම භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ ආයතනයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට උපකාරී වේ.

NLEAP හි සහයෝගය විශේෂයෙන් පරිවර්තනීය වූ එක් අංශයක් වන්නේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම (GEWE) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් විශ්ලේෂණය ප්ලස් (GBA+) ප්‍රවර්ධනය කිරීමයි. මෙම මූලධර්ම NILET හි ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කිරීම එහි පුහුණු වැඩසටහන් වල ගුණාත්මක භාවය සහ ඇතුළත් කිරීම පොහොසත් කර ඇත. NLEAP හි සහය තුළින්, ආයතනය තුළ දැනුම බෙදා හැරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව වර්ධනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන සම්පත් දායකයන් පුහුණු කිරීමට NILET සමත් වී ඇත.

NLEAP මගින් පහසුකම් සපයන NILET හි පර්යේෂණ ඒකකය ස්ථාපිත කිරීම සහ බලගැන්වීම, අතිමහත් වැදගත්කමක් ඇති කැපී පෙනෙන ජයග්‍රහණයක් පෙන්නුම් කරයි. ආයතනයේ පර්යේෂණ හැකියාවන් ශක්තිමත් කරමින් මෙම පර්යේෂණ ඒකකය සඳහා පදනම දැමීම සඳහා NLEAP හි තාක්ෂණික සහාය සැපයීම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. මෙම සන්ධිස්ථානය NILET හි පර්යේෂණ කටයුතුවල දැඩි ලෙස සහ ඵලදායී ලෙස උපකාර කිරීම මගින්, රට තුළ භාෂා අධ්‍යාපනය සහ පර්යේෂණ ක්ෂේත්‍රවල සැලකිය යුතු දියුණුවක් ඇති කරයි.

ව්‍යාපෘති කාලසීමාව අවසානයේ සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම තුළින් ධාරිතා ගොඩනැගීම සහ දැනුම බෙදාගැනීම සඳහා NLEAP හි කැපවීම තවදුරටත් නිදර්ශනය කරන ලදී. NLEAP හි NILET සහයෝගීතාවයේ විවිධ ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල ප්‍රදර්ශනය කිරීමට මෙම සම්මන්ත්‍රණය වේදිකාවක් විය. එය පාර්ශවකරුවන්ට ව්‍යාපෘතියේ බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සංසදයක් සැපයූ අතර NILET සහ NLEAP අතර ඵලදායී හවුල්කාරිත්වයට සාක්ෂියක් විය.

අවසාන වශයෙන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, මාර්ගගත විෂයමාලා සංවර්ධනය කිරීම සහ ශක්තිමත් පර්යේෂණ ඒකකයක් පිහිටුවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් NILET හි පුහුණු ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා NLEAP හි සහාය ප්‍රධාන වේ. භාෂා අයිතීන් ආරක්ෂා කිරීම සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා NILET හි මෙහෙවර සමඟ ජයග්‍රහණ සම්පාත වේ. NILET සිය ගමන දිගටම කරගෙන යන විට, NLEAP හි නොසැලෙන සහයෝගය සඳහා කෘතඥ වන අතර භාෂා අධ්‍යාපනය සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ තවදුරටත් ප්‍රගතියක් අපේක්ෂා කරයි.



භාෂාව පාලමක් ලෙසත්, සංස්කෘතිය බැඳීමක් ලෙසත්, උතුරටත් - නැගෙනහිරටත්

ශ්‍රී ලංකාව තුළ, දශකයක තුනක ජනවාර්ගික ආර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර සහ උතුරු පළාත්වල ගැඹුරු තුවාල සිදුවී තිබුණි. කෙසේ වෙතත්, 2007 දී ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය (NILET) පිහිටුවීම පශ්චාත් ආර්බුද කාලයෙන් ඔබ්බට විහිදුණු සුව කිරීමේ ක්‍රියාවලියක ආරම්භය සනිටුහන් කළේය. NILET මෙම යුද්ධයෙන් පීඩාවට පත් වූ හදවත් යථා තත්ත්වයට පත් කිරීම සඳහා වඩාත්ම බලගතු මෙවලම වන්නේ භාෂාව සහ සංස්කෘතික අවබෝධය බව හඳුනා ගත්තේය.

NILET විශේෂයෙන් නැගෙනහිර සහ උතුර පළාත් කෙරෙහි අවධානය යොමු කරමින් පුරවැසියන් අතර සංස්කෘතිය සහ ජනවාර්ගික පරතරය පියවීමේ මෙහෙවරක් ආරම්භ කළේය. භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැති කාලපරිච්ඡේද ඇතුළුව ආර්ථික අභියෝගවලට මුහුණ දුන්නද, NILET මෙම පළාත්වල සාමාන්‍ය මහජනතාව සහ රාජ්‍ය නිලධාරීන් යන දෙපාර්ශවයන්ට දෙවන භාෂා පුහුණු වැඩසටහන් සැපයීමට කැපවීමෙන් ක්‍රියා කරමින් සිටියි.


උදාහරණයක් වශයෙන්, 2002 දී පමණක් NILET විසින් නැගෙනහිර පළාතේ රාජ්‍ය නිලධාරීන් 1,200 කට පමණ භාෂා පුහුණු ලබා දෙමින් සිංහල/දෙමළ දෙවන භාෂා පුහුණු වැඩසටහන් 23 ක් පැවැත්වීය. විශේෂයෙන් සැලකිය යුතු කරුණ නම්, මෙම පළාත්වල රාජ්‍ය නිලධාරීන් සිංහල භාෂාව ඉගෙන ගැනීමට දක්වන අසීමිත උද්‍යෝගය, විසර ගණනාවක් තිස්සේ පැවති සංස්කෘතික බාධක සහ වැරදි වැටහීම් බිඳ දැමීමට ඔවුන් දක්වන උනන්දුව සතුටුදායක තත්ත්වයකි.
NILET හි භාෂා පුහුණු වැඩසටහන්වල බලපෑම පුද්ගල කුසලතා වර්ධනය ඉක්මවා යයි. එය සංස්කෘතික හුවමාරුව සහ අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය වන පරිසරයක් පෝෂණය කිරීමයි. මෙම වැඩසටහන් රාජ්‍ය නිලධාරීන් භාෂා ප්‍රවීණතාවයෙන් සන්නද්ධ කරනවා පමණක් නොව ගැඹුරින් මුල් බැසගත් සංස්කෘතික බාධක සහ වැරදි වැටහීම් මුලිනුපුටා දමා වඩාත් ඵලදායී සහජීවනයකට මග පාදා ඇත.

NILET හි උත්සාහයේ වැදගත්කම පළාත්වලින් ඔබ්බට විහිදේ. නැගෙනහිර සහ උතුරු ප්‍රදේශවල හදවත් සහ මනස සුවපත් කරමින් NILET රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහ රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම කිරීමට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. භාෂාව යනු සන්නිවේදන මාධ්‍යයක් පමණක් නොවන බවත්, එය සමගියට, අවබෝධයට සහ දීප්තිමත් අනාගතයකට පාලමක් බවත් එය ප්‍රබල මතක් කිරීමකි.

ඉදිරිය දෙස බලන විට, NILET හි දැක්ම පැහැදිලිය - එහි භාෂා ඉගෙනුම් වැඩසටහන් නවදුරටත් පුළුල් කිරීම. දෙවන භාෂා සිංහල ඩිප්ලෝමාව, තරුණයින් සඳහා භාෂා හුවමාරු වැඩසටහන් සහ සිසුන් සඳහා භාෂා කඳවුරු වැනි කටයුතු ද සිදුවෙමින් පවතී.

මෙම ප්‍රයත්නයන් මගින් දැනට පවතින තත්ත්වය නවදුරටත් වැඩිදියුණු කිරීම, වඩාත් ඇතුළත්, සංස්කෘතිකමය වශයෙන් පොහොසත් සහ භාෂාමය වශයෙන් විවිධත්වයෙන් යුත් ශ්‍රී ලංකාව පෝෂණය කිරීමේ පොරොන්දුව දරයි. NILET ගේ කාර්යය භාෂා ඉගැන්වීම පමණක් නොවේ, එය වඩාත් එක්සත් ජාතියක්, එක හදවතක් සහ එක වචනයක් පෝෂණය කිරීමයි.





2022 වසරේ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් නිම කරන ලද පාඨමාලාවන්ගේ සමස්ත සටහන

පාඨමාලාවන්ගේ ස්වභාවය	පාඨමාලා ගණන	පාඨමාලා ලාභීන් ගණන
භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් නිම කරන ලද පාඨමාලා		
පැය 100 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	1	31
පැය 150 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	87	5,052
පැය 200 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	21	839
එකතුව	109	5922
ආදායම් උත්පාදනයත් සමග නිම කරන ලද පාඨමාලා		
පැය 100 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	20	711
පැය 150 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	193	10,497
පැය 200 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	26	889
එකතුව	239	12097
මුලු එකතුව	348	18019

2022 වසරේ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් ආරම්භ කරන ලද 2023 වසරේ නිම කිරීමට ඇති පාඨමාලා සටහන

පාඨමාලාවන්ගේ ස්වභාවය	පාඨමාලා ගණන	පාඨමාලා ලාභීන් ගණන
භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් නිම කරන ලද පාඨමාලා		
පැය 100 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	2	130
පැය 150 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	2	220
පැය 200 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	-	-
එකතුව	4	350
ආදායම් උත්පාදනයත් සමග නිම කරන ලද පාඨමාලා		
පැය 100 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	1	22
පැය 150 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	58	3,485
පැය 200 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	5	374
එකතුව	64	3881
මුලු එකතුව	68	4231

2022 වසරේ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද සම්පූර්ණ පාඨමාලා (නිම කරන ලද සහ පැවැත්වෙන)

පාඨමාලාවන්ගේ ස්වභාවය	පාඨමාලා ගණන	පාඨමාලා ලාභීන් ගණන
භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් නිම කරන ලද පාඨමාලා		
පැය 100 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	3	161
පැය 150 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	89	5272
පැය 200 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	21	839
එකතුව	**113**	**6272**
ආදායම් උත්පාදනයත් සමග නිම කරන ලද පාඨමාලා		
පැය 100 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	21	733
පැය 150 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	251	13,982
පැය 200 සිංහල / දෙමළ භාෂා පුහුණු පාඨමාලා	31	1263
එකතුව	**303**	**15978**
මුලු එකතුව	**416**	**22250**

Certificate Courses and Dioloma Courses Started in the year 2022.

පාඨමාලාවන්ගේ ස්වභාවය	පාඨමාලා ගණන	පාඨමාලා ලාභීන් ගණන
සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාව	2	20
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා විශේෂ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වල ලද ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	7	280
ප්‍රංශ භාෂා සහතික පත්‍ර පාඨමාලාව	1	14
දෙවන බස සංහල භාෂා ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව	2	79
එකතුව	**12**	**393**

ගුරු පුහුණු පාඨමාලා (සම්පත් දායකයින්ගේ පුහුණු)

පාඨමාලාවන්ගේ ස්වභාවය	පාඨමාලා ගණන	පාඨමාලා ලාභීන් ගණන
සාමාන්‍ය ගුරු පුහුණු වැඩසටහන්	3	141
එකතුව	3	141


අධීක්ෂණ සහ පසුවිපරම් සැසිවාර

පාඨමාලාවන්ගේ ස්වභාවය	පාඨමාලා ගණන	පාඨමාලා ලාභීන් ගණන
අධීක්ෂණ සහ පසුවිපරම් සැසිවාර	8	521
එකතුව	**8**	**521**




භාෂාවත් සංස්කෘතියත් ප්‍රායෝගිකව අත්දැකීම් තුලින් ඉගෙන ගන්නා වග...


18/2020 චක්‍රලේඛයට අනුව ක්‍රියාත්මක කල සිංහල/දෙමළ දෙවන භාෂා පුහුණු වැඩසටහන්




2022 වසරේ පවත්වන ලද සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා



රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද දෙවන භාෂා පුහුණු වැඩසටහන් 2022




රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද දෙවන භාෂා පුහුණු වැඩසටහන් සඳහා සහභාගිත්වය




මූල්‍යමය ක්‍රියාකාරිත්වය

2019 සිට 2022 දක්වා


පුණරාවර්තන වියදම් ලැබීම්




සාමාන්‍ය ලැබීම්




ප්‍රාග්ධන වියදම් ලැබීම්




ලාභ / අලාභ සටහන




මුදල් ලැබීම්



2022 වසරේ ආදායම



ඉතුරුම් / ස්ථිර තැන්පතු




ආයතනයේ වත්මන් මූල්‍ය කාර්ය සාධනය

පසුගිය වසරවල ආයතනයේ වියදම් සිදුවී ඇති ආකාරය සලකා බලන විට ආයතනයේ වත්මන් වියදම් සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 75ක් වැය කර ඇත. තවද, ආදායම් උත්පාදනය කරනු ලබන භාෂා පුහුණු පාඨමාලා වලින් 2022 වර්ෂයේ දී ආයතනය 58% ක සාමාන්‍ය දළ ලාභයක් වාර්තා කර ඇත. එය මත පදනම්ව, 2023 වර්ෂයේ සිට මෙම ආයතනය ලාභදායී ආයතනයක් බවට පත් කිරීමට අදහස් කරන පුහුණු වැඩසටහන්වල ආදායම් සඳහා වන පුරෝකථනය පහත දැක්වේ.

- 2022	රු. 60,078,987
- 2022	58%
- 2022	රු. 74,407,175

අපේක්ෂිත ලාභය	සමායනය	10,000,000.00	25,000,000,00	50,000,000.00

ආයතනයේ පළමු මාස හත තුළ ආදායම් ලැබීම සැලකිල්ලට ගනිමින්, පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 30.60ක් ලැබී ඇති අතර මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලබා ගෙන නොමැත. කෙසේ වෙතත්, ආයතනය විසින් ස්වයං ජනනය කරන ලද ආදායම මිලියන 87.66 කි. මෙය ආයතනයට සමායන මට්ටමක් පවත්වා ගත හැකි මට්ටමෙන් ඔබ්බෙන් පවතියි. 2023 වසරේ මුල් මාස හත තුළ ආයතනයේ ඉපැයීම්වල වර්ධනය පහත ප්‍රස්ථාරයෙන් නිරූපණය කෙරේ.



ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලබන අතර සුදුසු පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් යටතේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිද යොදාගෙන ඇත.

සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර අවබෝධ කර ගැනීමට අදාළව අවශ්‍ය වන පෙර වර්ෂවල සංසන්දනාත්මක තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල ඇති දෑ ඉදිරිපත් කිරීම හෝ නැවත සංශෝධනය කිරීමට ඇති විට ප්‍රවර්ධන වර්ෂය සමග තහවුරු කිරීම සඳහා සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කර ඇත.

දේපළ, පිරියත, හා උපකරණ

දේපළ, පිරියත, හා යන්ත්‍රෝපකරණවල අගය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය වටිනාකම් අඩුකළ පසු අගයෙන්, වඩා අඩු අගයකට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මෙම වත්කම්වල පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම්, ඒවායේ ඵලදායී ජීවකාලය තුළ සමානුපාතිකව බෙදීයන පරිදි පහත සඳහන් ක්ෂය අනුපාත මත ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

විස්තර	ප්‍රතිශතය %
ගොඩනැගිලි හා ඉදිකිරීම්	2.5
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	10
පුස්තකාල පොත්	10
යන්ත්‍ර සූත්‍ර පිරියත හා උපකරණ	20
වාහන	25
පරිගණක	25
වෙබ් අඩවිය	25

ස්ථාවර වත්කම් මිලදී ගත් / ඉවත් කළ දිනය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

පාරිතෝෂික සඳහා වෙන් කිරීම

සේවකයකු සේවයට බඳවා ගත් දින සිට සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ සියලුම සේවා භවතුන්ගේ පෙර ගිණුම් වර්ෂයේ අවසාන මාසයේදී ලබාගත් මාසික වැටුපෙන් භාගයකට සමාන වටිනාකම පදනම් කරගෙන පාරිතෝෂික මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික මුදල් ගෙවීමට බැඳීමක් ඇති වන්නේ අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයකු සේවයෙන් ඉවත්වීමේ දීය.

ලැබිය යුතු ශේෂ

ලැබිය යුතු ගිණුම් ශේෂ, අපේක්ෂිත උපලබ්දි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ගිණුම් වර්ෂ අවසානයේදී ලැබිය යුතු ගිණුම් ශේෂවලින් උපලබ්ධි වීම අනපේක්ෂිත අගයන් පුරෝකථනය කරනු ලබයි. බොල් ණය ලෙස හඳුනා ගන්නා ණය ගැති ශේෂ එසේ හඳුනා ගත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම් කරනු ලබයි.

මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, අතැති මුදල්, බැංකු තැම්පතු, බැංකු අයිරා වටිනාකම් යන දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා වටිනාකම් පෙන්නුම් කරනු ලබයි.

ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු සිදුවී ඇති සිදුවීම්වලින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇතිකරන සිද්ධීන්වල බලපෑම මූල්‍ය ප්‍රකාශනවල අදාළ පරිදි ගැළපීම් කර ඇති අතර ඇතැම් සිදුවීම් හෙළිදරව් කිරීම් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දක්වා ඇත.

බැරකම් වෙනුවෙන් වෙන් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කරන දින වන විට නිශ්චිතව ගණනය කළ හැකි සියලු බැරකම් අගය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර වටිනාකම නිශ්චිතව නිර්ණය කළ නොහැකි බැරකම් වෙනුවෙන් අවශ්‍ය පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල වෙනුවෙන් වෙන් කිරීම.

සේවක භවතුන්හට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල් වෙනුවෙන් හිමිකමක් ඇති අතර පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් හා 3% ලෙස ආයතනය විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

ආදායම

පුනරාවර්ථන ආදායම් ලෙස ලැබෙන රාජ්‍ය ප්‍රදාන මහා භාණ්ඩාගාරය මඟින් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලැබෙන ප්‍රදාන ආයතනයේ ආදායමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර, ආයතනයේ සියලු ආදායම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ.

ප්‍රාග්ධන හා ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා දෙන ප්‍රදාන මෙහි ඇතුළත් වන අතර, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මෙමඟින් සිදු කරනු ලබයි.

පුහුණු පාඨමාලා ආදායම්

සියලුම පුහුණු පාඨමාලා සඳහා ලැබෙන ආදායම් පුහුණු පාඨමාලා සඳහා වන ආදායම් යන ශේෂය
යටතේ ද ආයතනයට ලැබෙන අනෙකුත් ආදායම්, අනෙකුත් ආදායම් යන ශේෂය යටතේ ද හඳුනාගෙන කටයුතු කරනු ලැබේ.

වියදම්

ආයතනය දෛනික කටයුතු පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන පුනරාවර්ථන වියදම් හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වෙනුවෙන් අදාළ වර්ෂයේදී දරන ලද සියලු වියදම් මේ යටතේ පෙන්නුම් කෙරේ.

තොග

පාඨමාලාවලට අදාළ පොත්පත්, ලිපි ද්‍රව්‍ය ඇතුළු සියලුම තොග අගයන් පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ක්ෂය ප්‍රතිපත්ති

2014 වර්ෂය දක්වා ක්ෂය කිරීමේදී අනුගමනය කළ මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන්කිරීමේ හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී එම ඉවත් කරන සම්පූර්ණ වර්ෂයටම ක්ෂය වෙන් නොකිරීමේ ප්‍රතිපත්තිය 2014 වර්ෂයෙන් පසු අදාළ වත්කම් මිලට ගත් දිනය හෝ ඉවත් කළ දිනය සලකා ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය දක්වා වෙනස් කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී "වක්‍ර ක්‍රමය" අනුගමනය කරන අතර මුදල් හා මුදල් සමාන දෑ තුළ බැංකු ශේෂ / අයිරා වටිනාකම්ද ඇතුළත් කර ඇත.

2021/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

සටහන		2021	2020
	සටහන	රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	06	32,820,028	41,066,102
ජංගම වත්කම්			
ලැබිය යුතු ශේෂ	07	21,340,672	9,949,531
තොග - ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන භාණ්ඩ		2,329,143	1,575,782
මුදල් හා මුදල් සමාන දෑ	08	129,762,038	75,236,348
සම්පූර්ණ වත්කම්		186,251,880	127,827,763
අරමුදල්, සංචිත සහ බැරකම්			
ප්‍රාග්ධනය		13,015,468	13,015,468
සමුච්චිත අතිරික්ත (හිඟය)		87,746,529	40,503,368
ප්‍රත්‍යාගණන සංචිත		47,000,892	47,000,892
		147,762,889	100,519,728
ජංගම නොවන බැරකම්	09		
පාරිතෝෂික වෙන් කිරීම්		6,343,228	5,529,673
		636,332	791,272
ජංගම බැරකම්		6,979,560	6,320,945

වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු වටිනාකම්	10	30,013,975	19,165,476
උපචිත වියදම්	11	1,495,457	1,821,614
		31,509,432	25,987,091
සම්පූර්ණ අරමුදල් සහ බැරකම්		186,251,880	127,827,763

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයක් ලෙස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මගින් 2022 දෙසැම්බර් 31 දින වනවිට සහ එහි ගෙවී ගිය වර්ෂය සඳහා වූ අතිරික්තය පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන බව අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන රජයේ නීති-රෙගුලාසිවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

ගණකාධිකාරි අධ්‍යක්ෂ ජනරාල්

අංක 1 සිට 3 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයක් වන අංක 8 සිට 13 දක්වා පිටුවල ඇතුළත් සටහන් කළමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ සභාපතිවරයාගේ වගකීම වේ. අභිනවයෙන් පත්කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත පළමු කළමනාකරණ මණ්ඩල රැස්වීම සඳහා මූල්‍ය ප්‍රකාශන සභාගත කරනු ලැබේ.

සභාපති කළමනාකරණ මණ්ඩල සාමාජික

2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරන ආදායම් ප්‍රකාශය

සටහන	2021	2022
	සටහන	රු	රු
ආදායම්			
භාණ්ඩාගාර ප්‍රතිපාදන	01	65,509,000	78,283,909
අමාත්‍යාංශය ප්‍රතිපාදන		103,597,400	22,732,875
අනෙකුත් ආදායම්	02	9,102,476	2,374,347
		178,208,878	103,401,021
වියදම්			
පරිපාලන වියදම්	03	(82,361,401)	(77,188,762)
පුහුණු පාඨමාලා සඳහා වන වියදම්	04	(48,231,241)	(40,055,155)
මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/(හිඟය)		47,616,236	13,833,696
මූල්‍ය වියදම්	05	(25,850)	(15,540)
බදු පෙර අතිරික්තය/(හිඟය)		47,590,386	13,849,436
බදු		-	-
වර්ෂය සඳහා අතිරික්තය / හිඟය		47,590,386	(13,849,436)

2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සටහන	දායක ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තය/(හිඟය)	ප්‍රත්‍යාගණන සංචිත	එකතුව
2021/01/01 දිනට ශේෂය	13,015,468	57,135,277	47,000,892	117,151,638
		(2,782,563)		(2,782,563)
පෙර වර්ෂය සඳහා අනුකූලන	-	(13,849,346)	-	(13,849,346)
2021/12/31 දිනට ශේෂය	13,015,468	40,503,368	47,000,892	100,519,729
පෙර වර්ෂය සඳහා අනුකූලන	-	(347,225)	-	(347,225)
වර්ෂය සඳහා අතිරික්තය / හිඟය	-	47,590,386	-	47,590,386
2022/12/31 දිනට ශේෂය	13,015,468	87,746,529	47,000,892	147,762,890

2021/12/31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහන ප්‍රකාශය

බදු පෙර අතිරික්තය/(හිඟය)	47,590,386	-13,849,346
මූල්‍යමය නොවන සංචලන සඳහා වන අනුකූලන		
ක්ෂය	7,797,309	7,662,017
පෙර වර්ෂයේ අනුකූලන	-347,225	2,782,563)
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	940,230	854,325
	55,980,700	-8,115,568
පොලි ආදායම	-8,642,138	-1,892,001
පාරිතෝෂික ගෙවීම්	-126,675	-
කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	47,211,887	-10,007,568
කාරක ප්‍රාග්ධන විචලන		
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු වටිනාකම්වල වැඩිවීම්/අඩුවීම්	-11,491,140	5,139,000
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු වටිනාකම්වල වැඩිවීම්/අඩුවීම්	10,522,341	5,836,384
තොග අඩුවීම්/වැඩිවීම්	-753,361	63,030
	45,589,726	1,030,845
	45,589,726	1,030,845
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	-261,405	733,590)
PPE – මෙහෙයුම් කටයුතුවල වෙනස	710,171	-
පොලි ආදායම	8,642,138	1,892,000
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ ලාභය	9,090,904	-1,158,410
මුදල් කටයුතු සඳහා වන මුදල් ප්‍රවාහන ප්‍රකාශය		
ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර මගින් ලැබූ ප්‍රතිපාදන	-154,940	791,272
මුදල් කටයුතු සඳහා වන ශුද්ධ මුදල් ප්‍රවාහන ප්‍රකාශය	-145,940	791,272
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ ප්‍රවාහය	54,525,690	2,980,528
වර්ෂය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	75,236,348	72,255,819
වර්ෂය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	129,762,038	75,236,348
සටහන - අ – මුදල් හා මුදල් සමාන දෑ		
බැංකු තැම්පත්	**129,762,038**	**75,236,348**

2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

සටහන් - 01 ආදායම්	2022	2021
	රු	රු
පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදාන	54,733,000	53,027,500
ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රදාන		
භාණ්ඩාගාරයෙන් ලැබීම්	10,776,000	26,000,000
අඩු කිරීම්– ජංගම නොවන වත්කම් සඳහා ප්‍රතිපාදන		-733,591
	10,776,000	**25,266,409**
	65,509,000	**78,293,909**
පුහුණු පාඨමාලා සඳහා ආදායම්	103,597,409	22,732,875
සටහන් 02 - වෙනත් ආදායම්		
මිල ගණන් කැඳවීමේ ආදායම්	42,000	145,000
පොලී ආදායම්	8,642,138	1,892,001
වැටුප් රහිත නිවාඩු හා වැටුපෙන් අඩුකිරීම්	48,012	-
ජංගම නොවන දේපළ සඳහා රජයේ ප්‍රදාන	154,940	29,081
ශාලා සහ නවාතැන් ගාස්තු	39,000	-
ලියාපදිංචි ගාස්තුව	8,000	-
වෙනත් ආදායම්	168,388	317,156
	9,102,478	**2,383,237**
සටහන් 03 - පරිපාලන වියදම්		
සේවක සංවේතන		
වැටුප් හා වේතන	25,015,029	22,469,833
සේ.අ.අ 12%	2,982,660	2,401,690
සේ.භා.අ 3%	745,665	670,497
සභාපති දීමනා	845,089	637,500
අතිකාල	190,547	265,641
නිවාඩු දින දීමනා	14,875	5,661

සටහන්	2022	2021
වෙනත් දීමනා	3,149,578	501,460
ප්‍රවාහන දීමනා	1,800,000	1,800,000
ඉන්ධන දීමනා	1,549,339	739,705
සම්පත්දායක දීමනා	598,950	361,000
කාර්ය මණ්ඩල පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන	883,125	-
සහභාගීත්ව හා ප්‍රවාහන දීමනා	247,740	85,000
දිරි දීමනා	675,000	630,000
පාරිතෝෂික වියදම්	940,230	854,325
ප්‍රවාහන - දේශීය	520,016	435,399
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ	500,771	1,444,697
ඉන්ධන දීමනා	834,781	1,029,563
නිල ඇඳුම්	36,000	28,000
සංග්‍රහ වියදම්	191,727	333,589
පුවත්පත් හා වෙනත්	95,821	41,718
නඩත්තු වියදම්		
වාහන	2,389,669	1,544,310
දේපළ හා පිරියත	341,959	527,316
පරිගණක	313,435	185,181
ගොඩනැගිලි	873,301	276,845
කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ	189,055	38,595
සේවා		
තැපැල් හා සන්නිවේදන	716,143	840,705
විදුලි	1,391,221	1,353,253
වතුර	240,173	136,976
කුලී වියදම්	16,866,625	17,323,695

සටහන්	2022	2021
ප්‍රවාහන	23,637	34,183
ආරක්ෂණ සේවා	3,853,818	3,619,667
පවිත්‍රතා සේවය හා වෙනත් කාර්ය මණ්ඩල වියදම්	3,928,006	3,794,391
වෙළඳ දැන්වීම්	-	101,223
පවිත්‍රතා සේවය	-	240,001
මෙහයුම් කල් බදු	407,430	3,557,518
විගණන ගාස්තු	326,400	330,000
භාෂා පරිවර්තන ගාස්තු	-	71,225
නීතිඥ ගාස්තු	439,250	300,000
කාර්යක්ෂමතා කඩඉම් විභාගය	-	186,478
වෙනත්	447,025	49,606
ක්ෂය		
ගොඩනැගිලි හා ඉදිකිරීම්	648,569	648,569
දේපළ පිරියත හා යන්ත්‍ර උපකරණ	56,795	50,929
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	1,959,620	1,927,016
වාහන	4,950,000	4,950,000
පරිගණක	66,076	66,076
අන්තර්ජාලය	116,250	19,428
	82,361,401	**77,188,762**

සටහන්	2022	2021
	රු	රු
සටහන් 04 - පුහුණු වැඩසටහන් සඳහා වියදම්		
සම්පත්දායක දීමනා	32,307,195	30,828,819
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	966,155	1,430,444
තැපැල් හා සන්නිවේදන	709,166	547,456
ආහාර හා සංග්‍රහ කටයුතු	3,401,860	2,336,397
නවාතැන් පහසුකම්	563,279	216,695
ගුරු අත්පොත් හා පෙළ පොත්	133,000	50,000
සහතික හා මුද්‍රණ ගාස්තු	148,325	210,800
තාක්ෂණික ගාස්තු	765,534	-
සහයක සේවා	-	45,928
අතිකාල දීමනා	1,407,857	692,011
නිවාඩු දින දීමනා;	268,572	268,531
ඉන්ධන	4,120,192	690,507
විදුලිය	444,314	37,934
වතුර	82,517	119,131
ගමන් වියදම් - දේශීය	964,630	327,210
පුහුණු හා සේවක මණ්ඩල ගාස්තු	-	1,782,029
ප්‍රවාහන හා සහභාගීත්ව දීමනා	138,600	46,600
වෙළඳ දැන්වීම්	27,216	12,500
කාර්යාල උපකරණ නඩත්තු	20,000	146,240
භාෂා පරිවර්තන ගාස්තු හා විභාග	-	37,953
පවිත්‍රතා වියදම්	51,800	227,350
ණයකරු	338,800	-
වෙනත්	116,176	620
	48,231,241	**40,055,155**

සටහන්	2022	2021
	රු	රු
සටහන් 05		
බැංකු ගාස්තු	25,850	15,450
	25,850	15,450

දේපළ, පිරියත හා උපකරණ	අනුපාතය	මුළු වියදම් 2021.01.01	ගැලපීම්	2022.12.31 ට මුළු පිරිවැය	2022.01.01 සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	2022.12.31 ට සමුච්චිත ක්ෂය	2022.12.31 W.D. අගය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම්	-	615,000	-	615,000	-	-	-	615,000
ගොඩනැගිලි හා ඉදිකිරීම්	2.50%	25,942,745	-	25,942,745	2,980,028	648,569	3,628,597	22,314,148
දේපළ, පිරියත හා උපකරණ	20%	13,491,456	-	13,491,456	13,373,410	56,795	14,430,205	61,251
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	10%	19,601,874	261,406	19,763,280	11,731,565	1,959,620	13,691,186	6,072,095
වාහන	25%	19,800,000		19,800,000	11,486,712	4,950,000	16,436,712	3,363,288
පුස්තකාල පොත්	10%	1,343,352		1,343,352	1,343,352	-	1,343,352	-
පරිගණක	25%	8,316,944		8,316,944	8,185,943	66,076	8,252,020	64,925
කාර්යාලීය වෙබ් අඩවිය	25%	465,000	-	465,000	19,428	116,250	135,678	329,322
		89,476,371	261,405	89,737,777	49,120,438	7,797,309	56,917,748	32,820,028
මුළු අගය								**32,820,028**

සටහන්	2022	2022
	රු	රු
සටහන් - 07 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ		
ලැබිය යුතු ශේෂ - හේවාසිංහ මහතා	58,983	58,983
ලැබිය යුතු ශේෂ - තුරම් මහතා	-	17,163
ලැබිය යුතු ශේෂ - නාපාවල මහත්මිය	9,650	9,650
ලැබිය යුතු ශේෂ - වික්‍රමසිංහ මහතා	9,650	9,650
ලැබිය යුතු ආදායම් - තැම්පත් පොලි	5,801,228	-
උත්සව අත්තිකාරම්	92,000	104,000
ලැබිය යුතු ශේෂ - රාජ්‍ය සේවා අමාත්‍යාංශය	-	275,000
ලැබිය යුතු තැම්පත්	201,500	161,500
ගොඩනැගිලි සඳහා අත්තිකාරම්	6,250,500	6,519,500
ලැබිය යුතු ශේෂ - බුද්ධ ශාසන අමාත්‍යාංශය	165,000	165,000
ලැබිය යුතු ශේෂ - සෞඛ්‍ය අමාත්‍යාංශය	-	338,000
ලැබිය යුතු පාඨමාලා ආදායම්	2,722,125	-
ලියාපදිංචි ආයතන මගින් ලැබිය යුතු ආදායම්	3,740,250	-
ලැබිය යුතු ආදායම් (රේඛීය අමාත්‍යාංශය) (අහෝසි)	2,290,285	2,290,285
	21,340,672	**9,949,531**

සටහන - 08 මුදල් හා මුදල් සමාන දෑ

ලංකා බැංකුව - C/A 0007442918		
ප්‍රාග්ධන	17,223	758,102
පුනරාවර්ථන	5,139,087	997,002
අමාත්‍යාංශය	-	270
ආදායම් ගිණුම	11,668,100	9,378,106
භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීම	-	6,150

සටහන්	2022	2022
	රු	රු
තැම්පතු ගිණුම A/C - BOC 79712746	577,750	64,096,718
ස්ථාවර තැම්පතු	112,359,858	-
අත්තිකාරම් ආදායම්	-	-
	129,762,038	75,236,348
සටහන - 09		
ස්ථාවර දේපළ සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී ප්‍රාග්ධන	636,332	
පාරිතෝෂික වෙන්කිරීම	6,343,228	791,272
	6,979,560	6,320,945
සටහන - 10 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ		
ආපසු ගෙවිය යුතු තැම්පතු	445,000	542,600
සම්පත්දායක දීමනා	16,526,885	13,976,035
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	722,830	-
සනීපාරක්ෂක සේවා	347,000	-
ආරක්ෂක සේවා	647,589	-
වික්‍රමාරච්චි ගොඩනැගිල්ල - අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	-	637,946
ලැබිය යුතු පාඨමාලා ගාස්තු	1,345,000	-
ගෙවිය යුතු විගණන ගාස්තු	723,600	1,050,000
පෙළ පොත් හා අත්පොත් සකස් කිරීම	423,000	-
ගෙවිය යුතු බදු	5,450,600	-
ගෙවිය යුතු පාඨමාලා ගාස්තු	13,500	-
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	409,476	226,521
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා වැඩසටහන්	2,959,496	2,959,496
	30,013,975	19,391,998

සටහන්	2022	2022
	රු	රු
සටහන් 11		
තැපැල් හා සන්නිවේදන	71,791	126,884
විදුලි ගාස්තු	146,456	83,306
ජලය	18,164	2,640
ඉන්ධන	195,680	-
ආහාර	22,800	-
ආරක්ෂක සේවා		346,775
අතිකාල දීමනා	455,342	206,175
නිවාඩු දින දීමනා	8,184	59,995
පුහුණුකරුවන් සඳහා වියදම්	-	52,500
භාෂා පරිවර්තන ගාස්තු	-	37,953
සහභාගීත්ව දීමනා	8,500	-
සනීපාරක්ෂක සේවා	-	379,847
වාහන බදු	454,540	-
පෙළ පොත් හා ගුරු අත්පොත් සකස් කිරීම	-	290,000
නවාතැන් පහසුකම්	25,000	-
පරිගණක නඩත්තු	45,000	-
මුද්දර සේවා	8,350	-
	1,495,457	1,595,092
සටහන් - 12 පෙර වර්ෂය සඳහා ගැළපීම		
අභ්‍යන්තර වැඩ සඳහා අමතර වෙන්කිරීම	-	-279,199
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වෙන්කිරීම	275,000	-
අගලවත්ත නවීකරණ කටයුතු	72,225	-
ලැබිය යුතු ශේෂ - සෞඛ්‍ය අමාත්‍යාංශය	-	2,975,000
ස්ථාවර තැම්පතු සඳහා රජයේ ප්‍රතිපාදන	-	86,762
	347,225	2,782,563

සටහන් - 13 ආයතනයට එරෙහිව පවරා ඇති නඩු

- සේවයෙන් පහකර ඇති පී.එම්.එම්.පිර්තවිස් මහතා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයට එරෙහිව නඩුවක් ගොනු කර එම නඩුව 33/1415/2019 අංක යටතේ හෝමාගම කම්කරු උසාවියේ විභාගවෙමින් පවති.
- සේවයෙන් පහකර ඇති සී.සී.සිල්වා මහතා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයට එරෙහිව නඩුවක් ගොනු කර එම නඩුව 33/1560/2021 අංක යටතේ හෝමාගම කම්කරු උසාවියේ විභාගවෙමින් පවති.
- ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි වශයෙන් කටයුතු කරන පී.පස්මිලා රවිරාජ් මහත්මිය තමාට අධ්‍යක්ෂ තනතුර අහිමිවීම සම්බන්ධව අභියාචනා අධිකරණයේ CA/WRIT/218/2019 යන අංක යටතේ නඩුවක් ගොනු කර ඇති අතර එම නඩුව දැනට විභාගවෙමින් පවති.
- ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන ප්‍රසාත් ආර්. හේරත් මහතා තමන්ව සේවයෙන් පහකිරීම හේතුවෙන් ආයතනයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ SC/FR/424/2019 යන අංක යටතේ නඩුවක් ගොනු කර ඔහුව නැවත සේවයේ පිහිටුවීමෙන් අනතුරුව එම නඩුවෙන් ඉල්ලා අස්වී ඇත.
- 2019 වර්ෂයේ පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා වරලත් ආයතනයක් වශයෙන් ලියාපදිංචි කළ නිෂා ඇකඩමි ආයතනය තමන්ගේ ආයතනයට ගෙවිය යුතු රු.446,485 මුදල නොගෙවීම හේතුවෙන් මෙම ආයතනයට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවක් ගොනු කර ඇත.

2022.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන් - 14 - 2019 අයවැය යෝජනා අනුව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

2019 අයවැය යෝජනා අනුව අ.ම.ප අංක 19/2693/131/018-1 අනුව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ආරම්භ කර ඒ සඳහා වන වියදම වූ රු.37,395,922 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිතයි. 2019 වර්ෂයේ සිට එම වැඩසටහන අත්හිටුවා ඇත.

සටහන් - 15 අදාළ පාර්ශව හෙළිදරව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිති ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීමට අදාළ පාර්ශවයන් ලෙස අර්ථ දක්වා ඇති පාර්ශවයන් සමග ආයතනය සිය ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේදී ගනුදෙනු සිදු කරයි. ඒවායේ විස්තර පහතින් වාර්තා වේ.

අ) ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙන් සමග ගනුදෙනු

ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට ආයතනය ක්‍රියාකාරම් පරිපාලනය කිරීමේ අධිකාරිය සහ වගකීම ඇත. අධ්‍යක්ෂ ජනරාල් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි වන අතර ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වේ.

නම	තනතුර	හානි පූරණය	
		සහභාගිවීමේ දිමනාව	මාසික වැටුප් අත්තිකාරම
ජේ.බී හින්කෙන්ද මහතා	සභාපතිතුමා	-	2,135,840
අනුරාධ විජේකෝන් මහතා	සාමාජික	25,500	
කේ.ඩී.එස්.කේ.සිරිවර්ධන මහතා	සාමාජික	42,500	
එස්.සෙන්තුරම් මහතා	සාමාජික	25,500	
පී.කේ.විතානගේ මහත්මිය	සාමාජික	34,000	
ඩබ්.කේ.කොලඹගේ මහතා	සාමාජික	8,500	
දිනුක් හෙට්ටිආරච්චි මහතා	සාමාජික	34,000	
චතුරිකා රණවීර මහත්මිය	සාමාජික	17,000	
පී.එච්.පී.එච්.හේරත් මහතා	සාමාජික		3,097,470

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/C/ NILET/FS/01/22/07 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 15 දින

සභාපති
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.21,260,122 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් පාවිච්චි කරනු ලබන වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2019 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව ආයතන 11 ක් විසින් භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වා ඉන්වොයිස් ඉදිරිපත් කර තිබියදී ගෙවියයුතු රු.37,395,922 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) (ආ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3 වන පරිච්ඡේදයේ 3.2(V) ඡේදය	රජය සතු ව්‍යවසායන් දිරිදීමනා ගෙවීමේදී දිරිදීමනා යෝජනා ක්‍රමයක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමත කර ගත යුතු වූවද එකී උපදෙස් වලට අනුගත නොවී සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ නිලධාරීන්ට රු 675,000 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය වක්‍රලේඛය	රජයේ ආයතන මඟින් ගොඩනැගිලි කුලියට ගැනීම නැවැත්විය යුතු වුවද ආයතනය පවත්වාගෙන යනු ලබන කුලී ගොඩනැගිල්ල සඳහා 2023 පෙබරවාරි 13 වන දින දක්වා රු.1,350,000 ක මාසික කුලියකට ගිවිසුම් ගත වී වර්තමානය වන විටත් එම ගොඩනැගිල්ලේම ආයතනය ස්ථාපිත කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **වෙනත් කරුණු**

(අ) අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.2,290,285 ක්, ගුවන් විදුලි වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ගෙවිය යුතු රු.2,500,676 ක් හා රූපවාහිනී වැඩසටහන් සඳහා ආසක් මීඩියා (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු රු.458,820 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු නොකර ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි.

(ආ) ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සම්පත් දායකයන්ට ගෙවිය යුතුව පැවති රු.2,449,985 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ සටහන් සඳහා නිරීක්ෂණ

01.2 මූලික අදහස්

කරුණු දෙකක් පදනම් කරගෙන විගණකාධිපති විසින් 2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සම්බන්ධ සුදුසු විගණන සටහන් ප්‍රකාශයට පත් කර ඇත. එහි පළමු කරුණ වශයෙන් ස්ථාවර තැම්පතු කාලය දීර්ඝ කළ යුතු බව හා ඒ සම්බන්ධ තක්සේරු වාර්තාවක් ලබා දිමට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත බොහෝ වාරයක් යොමු කර තිබුණි. එමගින් ලබාගන්නා වාර්තාව අනුව තක්සේරු ගැළපීම සිදු කළ යුතුය.

දෙවන කරුණ වශයෙන් සඳහන් කර ඇත්තේ 2019 වර්ෂයේ අයවැය යෝජනාව අනුව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති අතර රටේ පැවැති දේශපාලන හා ආර්ථික අවිනිශ්චිතභාවය හේතුවෙන් මහා භාණ්ඩාගාරයෙන් අදාළ මුදල නොලැබීම නිසා අදාළ වැඩසටහන අත්හිටුවන ලදි. පසුව අදාළ වැඩසටහනට සම්බන්ධ වූ පුහුණුකරුවන්ට ANLEAP ව්‍යාපෘතියේ සහයෝගයෙන් පුහුණුව ලබාදී එම පුහුණුකරුවන් ආයතනයේ සම්පත්දායක මඩුල්ලට බඳවා ගැනීමට කටයුතු කරන ලදි.

2. නීති හා කාලීන අවශ්‍යතා සම්බන්ධ වාර්තාව

අ.) පසුගිය කාලවලදී සිදු කරන ලද ආයතනයේ කාර්යයන් මගින් ආයතනය ඉහළ මට්ටමින් දියුණු වූ ඇති අතර එමගින් මිලියන 165ක් ස්ථාවර තැන්පතුවක් ලෙස ඉතුරු කිරීමට හැකි විය. මේ සඳහා ආයතනයේ විශේෂයෙන් සඳහන් කලහැකි පිරිසක් පමණක් සහයෝගයක් ලබා දී තිබේ. මෙම ආයතනයේ නිලධාරීන්ට මාසික වැටුප හැර වෙනත් කිසිදු දීමනාවක් නොලැබීම හේතුවෙන් පසුගිය වර්ෂයේ අමාත්‍යතුමාගේ අනුමැතිය මත සේවක පිරිසට රු. 15000 ක් බැගින් ප්‍රසාද දීමනා ලබා දී ඇත. ඒ අනුව 2022 වර්ෂයේදී ද කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සමග (140. 8) ප්‍රසාද දීමනාවක් ලබා දී තිබුණි.

ආ.) ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ ප්‍රධාන කාර්යාලය දැනට පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2016 වර්ෂයේ සිට අමාත්‍ය මණ්ඩලයේ සහ එවකට පැවති කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත ගිවිසුම් ගතව මාසිකව මිලියන 1.25ක කුලී පදනමට ලබා ගෙන ඇත. 2019 වර්ෂයේ ලබාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, 2020 නව කළමනාකරණ මණ්ඩලය අනුමැතියට යටත්ව අමාත්‍යවරයාගේ නිර්දේශය අනුව, එම පෙර ගිවිසුම තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා අලුත් කරන ලදි.

2016 වර්ෂයේ ලබාගත් රජයේ ප්‍රධාන කත්සේරුකරුගේ තක්සේරුව මත 2019 වර්ෂයේ ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය මත, 2020 වර්ෂයේ සිට 2023.02.13 දක්වා නැවත මෙම ගොඩනැගිල්ල සඳහා ගිවිසුම්ගතව ඇත. වෙනත් ගොඩනැගිල්ලක් සොයා ගැනීම සඳහා නොයෙක් විට උත්සාහ දැරුවත් එය සාර්ථක නොවූ හෙයින් මෙම ගොඩනැගිල්ලේම කාලය දීර්ඝ කරන ලෙස කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා අමාත්‍යතුමා වෙත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

2.3 අනෙකුත් කරුණු

මෙම මුදල 2018 වර්ෂයේ ආයතනයේ රේඛීය අමාත්‍යාංශය වන ජාතික ඒකාබද්ධතා ජාතික භාෂා සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ අතිරේක ප්‍රතිපාදන තුළින් කරන ලද වැඩසටහන් වෙනුවෙන් ආයතනය වෙත ලැබීමට තිබූ මුදලකි. 2019 වර්ෂයේ රජය වෙනස් වීමෙන් පසු අදාළ අමාත්‍යාංශ විෂය පථය

අධිකරණ අමාත්‍යාංශය තුළට යොමුවිය. දිගින් දිගටම මෙම මුදල ආයතනයේ ගිණුම්වල පවතින හෙයින් විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් මත අධිකරණ අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කළද, එම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන නොමැති බව 2023.06.19 දින දන්වා ඇත. එම මුදල ගිණුම්වලින් කපා හැරීම සඳහා කළමනාකරණ මණ්ඩලයට යොමු කිරීමට නියමිතය.

අදාළ තොග ගිණුමෙන් ඉවත් කිරීම සඳහා ඉල්ලා සැලසුම් සභාවට ඉදිරිපත් කරන ලදි. 2019 වර්ෂයට අදාළ ප්‍රතිපාදන අනුව ගුවන්විදුලි වැඩසටහන සඳහා අදාළ ගෙවීම් කළ යුතුය. අදාළ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ගිණුම්වල එම මුදල ගෙවිය යුතු මුදල් ලෙස සඳහන් වේ.

ආ.) භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රාජ්‍ය නිලධාරීන් සඳහා පැවැත්වූ ප්‍රහුණු වැඩසටහන්වලට සම්පත්දායකයන්ට එම මුදල ගෙවිය යුතුය. පසුගිය වර්ෂයේ සීමිත ප්‍රමාණයක් පමණක් මුදල් ලැබීම හේතුවෙන් එම මුදල දැනටමත් ගෙවිය යුතු ශේෂ ලෙස පෙන්නුම් කර ඇත.

එම සම්පත්දායකයන් සඳහා අදාළ දීමනා ගෙවීමට මුදල් ඉලලා සිටින අතර අදාළ මුදල ලැබුණු පසු එම දීමනා ගෙවනු ලැබේ.

ජයම්පති බණ්ඩාර හින්කෙන්ද
සභාපති
NILET



අභියෝග.....

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ කාර්යයන් සාර්ථකව කරගෙන යාම සඳහා සුදුසු පරිපාලන ව්‍යුහයක් ඇති කිරීම අපගේ ඉලක්කය වේ.

ආයතනයේ ඉලක්ක කරා ළඟා වීමට දැනට කාර්ය මණ්ඩල හිඟයක් පවතින අතර වත්මන් හා අනාගත අභියෝග ජය ගැනීමට අදාළ ප්‍රධාන හා අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩුව පවති.

බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් කර ඇති සමහර සීමාවන් සඳහා අධ්‍යක්ෂ (පුහුණු) සහකාර අධ්‍යක්ෂ (පුහුණු) යන ප්‍රධාන තනතුරු පුරප්පාඩුව පවති. එම තනතුරුවලට සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා බඳවාගැනීමේ පටිපාටියෙහි යම්කිසි සංශෝධන කළ යුතු වේ.

අප ආයතනයෙහි ඇති වාහන නිෂ්පාදිත දින සිට මේ වන විට අවුරුදු 20 ට වැඩි කාලයක් පැරණි වන බැවින් එම වාහනවල නඩත්තු වියදම් හා අලුත්වැඩියා වියදම් ඉතා වැඩිවී තිබේ. එබැවින් මේ සඳහා නව වාහන භාවිතය සඳහා යොදා ගැනීමට අවශ්‍ය වේ.

ආයතනයේ ප්‍රධාන කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානය සඳහා නිශ්චිත ගොඩනැගිල්ලක් බස්නාහිර පළාතෙහි තිබීම අත්‍යවශ්‍ය දෙයක් වන අතර එසේම සෑම පළාතකම ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයක් තිබීමත් වැදගත් වන බව හඳුනාගෙන ඇත.

අප ආයතනයෙහි පවතින වැදගත්ම වත්කම වන්නේ ඉතාමත් වගකීමෙන් හා කැපවීමෙන් සේවය කරනු ලබන අපගේ කාර්ය මණ්ඩලයයි. ඔවුන් සඳහා කිසිදු සුබසාධන හෝ ප්‍රසාද දීමනා හෝ අනිකුත් පහසුකම් කිසිවක් ලබා නොදීම කණගාටුවට කරුණකි.

මේ හේතුවෙන් වෛද්‍ය රක්ෂණාවරණයක් හා ආපදා ණය යනාදී සේවක සුබසාධක සැලසුම් හා වාර්ෂික හා මාසික ප්‍රසාද දීමනා හෝ ලාභ බෙදීයාම හෝ අභිප්‍රේරණ සැලසුම් ආදිය අදාළ බලයලත් නිලධාරීන්ගෙන් අනුමැතිය ලබාගෙන ගෙවීමට කටයුතු කළ යුතු වේ.

